**ලංකා ඉලෙක්ට්‍රිසිටි (පුද්ගලික) සමාගම - 2016**

**------------------------------------------------------------**

ලංකා ඉලෙක්ට්‍රිසිටි (පුද්ගලික) සමාගමේ ("සමාගම") 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් සහ වියදම් ප්‍රකාශනය හා වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ සමාගම සහ එහි පරිපාලිතන්හි ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ("සමූහය") ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාර මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයිඅදහස් කරනු ලබන සමාලෝචිත වර්ෂයේ සමාගමේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් මාගේ අදහස් දැක්වීම් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ. මෙම විගණනයේදී, මා විසින් ප්‍රසිද්ධ වෘත්තියේ නියැලුණු වරලත් ගණකාධිකාරී සමාගමක සහාය ලබාගන්නා ලදි.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම**

**---------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ ("මණ්ඩලය") වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**-------------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

------------------

### 2.1 මතය

------

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට සමූහයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 2.1.1 වෙනත් කරුණු

-------------------

ලංකා ඉලෙක්ට්‍රිසිටි (පුද්ගලික) සමාගමේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ප්‍රසිද්ධ වෘත්තියෙහි යෙදී සිටින වෙනත් වරලත් ගණකාධිකාරී සමාගමක් විසින් විගණනය කරන ලද අතර එම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් නොවෙනස් මතයක් ඔවුන් විසින් 2016 මැයි 13 දින ප්‍රකාශ කර තිබුණි.

### 2.1.2 වෙනත් නීතිමය හා නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තා කිරීම

------------------------------------------------------------------------------

2007 අංක 07 දරන සමාගම් පනතේ 163 (2) වගන්තියේ නියමය පරිදි, පහත සඳහන් කරුණු මම ප්‍රකාශ කරමි.

(අ) විගණන මතය සඳහා පදනම හා විෂය පථය සහ විගණනයේ සීමා කිරීම් ඉහත සඳහන් පරිදි වේ.

(ආ) මාගේ මතය වනුයේ,

- මා විසින් විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු හා පැහැදිලි කිරීම් ලබා ගන්නා ලද බව සහ මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සමාගම විසින් විධිමත් ගිණුම්කරණ වාර්තා පවත්වා ඇති බවත්,

- 2016 දෙසැම්බර් 31 දිනට සමාගමේ මූල්‍ය ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා එහි මුදල් ප්‍රධාන සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

- සමාගමේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 සහ 153 වගන්තිවල අවශ්‍යතාවයන්ට අනුකූල බවයි.

## 3. මූල්‍ය සමාලෝචනය

-------------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵලය

----------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමූහයේ මෙහෙයුම්වලින් රු.2,266,799,000 ක බදු පූර්ව ශුද්ධ ලාභයක් වාර්තා කර තිබූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ බදු පූර්ව ශුද්ධ ලාභය රු. 1,523,935,000 වූයෙන් සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු.742,864,000 කින් වර්ධනයක් දැක්වුණි. වෙනත් ආදායම් සහ මූල්‍ය ආදායම් පිළිවෙලින් රු.166,663,000 ක් සහ රු.370,475,000 වීම ඉකුත් වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------------

### 4.1 මානව සම්පත් කළමනාකරණය

----------------------------------------

සමාගමේ තත්ය සහ මණ්ඩලය විසින් 2016 දෙසැම්බර් 31 දිනට අනුමත කරන ලද කාර්ය මණ්ඩලය පිළිවෙලින් 1,558 ක් සහ 1,649 ක් වූ අතර තනතුරු 91 ක පුරප්පාඩු පැවතුණි. කෙසේ වෙතත්, 2003 ජුනි 02 දිනැති රාජ්ය ව්යාපාර චක්රලේඛ අංක පීඊඩී/12 සඳහන් පරිදි සියළු කාර්ය මණ්ඩල ආවරණය වන සේ නිසි පරිදි අනුමත කරන ලද බඳවා ගැනීමේ පටිපාටියත් සමාගම සතුව නොතිබුණි.

### 4.2 කළමනාකරණ ක්රියාකාරකම්

--------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් සිදුකෙරේ.

(අ) ලංකා ඉලෙක්ට්රිසිටි (පුද්ගලික) සමාගම සහ ලංකා විදුලි බල මණ්ඩලය අතර විදුලිය මිලදී ගැනීම සම්බන්ධයෙන් විධිමත් ගිවිසුමක් නොපැවතුණි.

(ආ) ගිණුම්කරණය හා මෙහෙයුම් කාර්ය පටිපාටීන් සම්බන්ධයෙන් වූ අත්පොත් 2002 වර්ෂයේ සිට යාවත්කාලීන කර නොතිබුණි.

(ඇ) රු.මිලියන 286 ක් වූ වීදි ලාම්පු පාරිභෝගිකයන්ගෙන් ලැබිය යුතු වෙළඳ ලැබීම් දීර්ඝ කාලයක් මුලුල්ලේ හිඟව පැවතිණි.එම මුදල් අයකර ගැනීම සඳහා ක්රියාමාර්ග ගෙන නොතිබූ අතර අදාල මුදල මූල්ය ප්රකාශනයන්හි සම්පූර්ණයෙන්ම හානිකරණය කර තිබුණි.

## 5. තිරසර සංවර්ධනය

------------------------

තිරසර සංවර්ධන අරමුණු පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර "2030 න්යාය පත්රය" ප්රකාරව සියළු රාජ්ය ආයතන සිය විෂය පථය යටතේ වූ අරමුණු සහ ක්රියාකාරකම් ඉටුකළ යුතුව පවතී. එහෙත් සමාගම තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් දැනුවත් වී නොසිටි අතර ළඟාකරගත යුතු ඉලක්කද හඳුනා ගෙන නොතිබුණි. එමෙන්ම අරමුණු ළඟාකර ගැනීමේ සන්ධිස්ථාන හා තිරසර සංවර්ධන දර්ශකද හඳුනාගෙන නොතිබුණි.